# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,573 - 2008 ඔක්තෝබර් මස 24 වැනි සිකුරාදා - 2008.10.24

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1386 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 1391 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1388 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1394 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - (i) ශ්‍රී ලංකා භූ දර්ශන නිර්මාණ ශිල්පි ආයතනය පනත් කෙටුම්පත 2008 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) විසර්ජන පනත් කෙටුම්පත 2008 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(iii) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනත් කෙටුම්පත 2008 සැප්තැම්බර් මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ඔක්තෝබර් මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ඔක්තෝබර් මස 17 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

1385 - B 079951 — 9,160 (2008/10)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, වවුනියාව**

2009 වර්ෂය සඳහා අවශ්‍ය සැපයීම්/සේවාවන්

(01) වවුනියාව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාසයට අයත් රෝහල්වලට පහත දැක්වෙන සැපයීම්/සේවාවන් සඳහා ටෙන්ඩර්පත් මෙයින් කැඳවනු ලැබේ :

*(අ)* නොපිසින ලද/පිසින ලද ආහාර සැපයීම,
*(ආ)* කිලුටු රෙදි සේදීම.

(02) 2009 වර්ෂයේ ජනවාරි මස 01 වැනි දා සිට දෙසැම්බර් මස 31 වැනි දින තෙක් වූ කාල පරිච්ඡේදය සඳහා මෙම සැපයීම්/සේවාවන් සඳහා ශ්‍රී ලාංකිකයින්ගෙන් නැතහොත් ශ්‍රී ලංකාවේ වෙළඳ ආයතනවලින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. ටෙන්ඩර් ලියකියවිලි 2008.10.20 වැනි දින සිට 2008.11.05 වැනි දින පස්වරු 3.30 දක්වා වවුනියාව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ. ඒක රෝහලක්/සංකීර්ණයක් සඳහා නියමිත එක් සැපයීම්/සේවා සඳහා වන ලියකියවිලි කට්ටලයක් පමණක් නිකුත් කරනු ලැබේ.

(03) රජයේ කොන්ත්‍රාත්තු නොකළ හැකි පරිදි තහනම් කරන ලද අය හෝ තහනම් කරන ලද ආයතනවලට හෝ ටෙන්ඩර්පත් නිකුත් කරනු නොලැබේ.

(04) ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති අය පහත දැක්වෙන මුදල් ප්‍රමාණය ගෙවිය යුතු අතර ආහාර සැපයීම, රෙදි සේදීම යනාදී හා සම්බන්ධ වටිනාකම් ලියකියවිලි ද, වවුනියාව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය වෙත ඉදිරිපත් කර ටෙන්ඩර් ලියකියවිලි ලබාගත හැකිය. ටෙන්ඩර්පත් 2008.11.11 වැනි දින පෙරවරු 10.00 දක්වා භාරගනු ලැබේ.

(05) *තැන්පත් කිරීමේ ප්‍රමාණය හා ලියකියවිලි :-*

*(අ)* **නොපිසන ලද/පිසන ලද ආහාර සැපයීම**

| *රෝහල* | *ආපසු නොගෙවන තැන්පත් ප්‍රමාණය රු.* | *ආපසු ගෙවන තැන්පත් ප්‍රමාණය රු.* | *වටිනාකමේ සහතිකය රු.* |
|---|---|---|---|
| මූලික රෝහල (වර්ගය බී)<br>01. (සෙට්ටිකුලම) | 500 | 25,000 | 75,000 |
| ප්‍රාදේශීය රෝහල - 07<br>(පුවරසන්කුලම්, උළුක්කුලම, නේරියකුලම, මාමඩුව, පුලියන්කුලම, සිදම්බරපුරම්, නෙඩුන්කේනි) | 250 0 | 15,000 බැගින් | 25,000 බැගින් |
| **දිස්ත්‍රික් ආයුර්වේද රෝහල** .- (01) (පම්පෙයිමඩු) | 250 0 | 25,000 0 | 50,000 0 |
| **කිලුටුරෙදි සේදීම** | | | |
| මූලික රෝහල 01 (සෙට්ටිකුලම් රෝහල ) | 150 0 | 5,000 0 | 15,000 0 |
| ප්‍රාදේශීය රෝහල් - 07<br>(පුවරසන්කුලම, උළුක්කුලම, නේරියකුලම, මාමඩුව, පුලියන්කුලම, සිදම්බරපුරම් නෙඩුන්කේනි) | 100 0 | 1,500 බැගින් | 5,00 බැගින් |
| දිස්ත්‍රික් ආයුර්වේද (රෝහල) (01)<br>පම්පෙයිමඩු | 100 | 1,500 | 5,000 |

*(ඇ)* **ලියකියවිලි .-**

01. 2008.10.01 වැනි දායින් පසුව ඒ ඒ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් තමන්ගේ දේපළවල වටිනාකම සහතික කිරීමේ සහතිකය (පී. එස්. එම්. 20 පොදු 170 ආකෘතිය) නැතහොත් බැංකුවේ වගකීම් සහතිකය.

02. මීට පෙර සිටම සේවාව ලබාදෙන කොන්ත්‍රාත්කරුවන් ඊළඟ කාලය සඳහා නවකයින් ලෙස සලකා තීරණ ගනු ලැබේ.

03. ටෙන්ඩර් වේලාව පසු වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ඉල්ලුම්කරු හෝ ලිඛිතව පත්කරන නියෝජිතයෙකු හෝ ටෙන්ඩර් විවෘත කිරීමේ දී පැමිණ සිටිය හැකිය.

04. ටෙන්ඩර් පිළිබඳව ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

05. වැඩි විස්තර කෙලින්ම හෝ නැතහොත් දුරකථන අංක 024-2222140 මගින් නැතහොත් ගණකාධිකාරී ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයෙන් ලබාගත හැකිය.

වෛද්‍ය එම්. මහේන්ද්‍රන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
වවුනියාව.

10-683

---

**මහ රෝහල - වවුනියාව**

2009 වර්ෂය සඳහා මෙම රෝහලට අවශ්‍ය සේවයන්

2008 දෙසැම්බර් මස 2009 දෙසැම්බර් මස 20 වැනිදායින් (දින දෙකම ඇතුලුව) අවසාන වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් සේවයන් සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර වවුනියාව මහ රෝහලේ වෛද්‍ය අධ්‍යක්ෂක විසින් භාරගනු ලැබේ.

01. සේවයන්ගේ විස්තර හා තැන්පත් මුදල් පහත දැක්වේ :

| *අනු අංකය* | *විස්තර* | *ටෙන්ඩර් තැන්පතු මුදල් (ආපසු නොගෙවන* | *ටෙන්ඩර් තැන්පතු (ආපසු නොගෙවන* | |
|---|---|---|---|---|
| A | ආහාර සැපයීම (අමු ආහාර ද්‍රව්‍ය) | 1,000 | 50,000 | 250,000 |
| B | කිලිටි රෙදි සේදීම : | | | |
| | I කොටස | 500 | 15,000 | 75,000 |
| | II කොටස | 500 | 15,000 | 50,000 |
| C | ආරක්ෂක අංශය | 1,000 | 50,000 | |
| D | ක්ලීනින් සේවය | 1,000 | 50,000 | |
| E | පරිඝණක අලුත්වැඩියා කිරීම | 500 | 10,000 | |
| F | වායුසමන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 1,000 | 15,000 | |
| G | ශීතකරණ අලුත්වැඩියා කිරීම | 1,000 | 5,000 | |
| | මෘත ශරීරාගාරය | | | |
| H | විදුලි සෝපානය | 2,000 | 25,000 | |

02. *වත්කම් විස්තර.*-2008.10.15 න් පසු දිස්ත්‍රික් ලේකම්ගෙන් වත්කම් පිළිබඳ ගන්නා ලද විස්තර (පොදු 170 A, B ට පමණක්) බාරදිය යුතුයි. නැතහොත් බැංකුව මගින් ලබාගන්නා මුදල් වත්කම් ප්‍රකාශයක් ලබා ගත යුතුයි. මීට පෙර මෙම රෝහලේ සේවයන් පවත්වාගෙන යන ටෙන්ඩර් කරුවන් ද මෙම වත්කම් ප්‍රකාශය ලබා ගත යුතුයි.

03. *තැන්පතු පිළිබඳ විස්තර.*- ඉහත සඳහන් කරන ලද මුදල් වවුනියාව මහ රෝහලේ මුදල් අංශයට ගෙවා මුදල් කුවිතාන්සියක් ලබාගත හැක. ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසු ටෙන්ඩර් සඳහා සුදුසුකම් නොලැබූ අයගේ ගෙවන ලද මුදල් ආපසු ලබා ගැනීමට පුළුවන.

04. *ටෙන්ඩර් ලියාපදිංචි කිරීමේ විස්තර.*- මෙම ටෙන්ඩර් භාර දීමේ දී ඔබගේ ටෙන්ඩර් සම්බන්ධ ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

05. *පළපුරුද්ද පිළිබඳ සහතිකය.*- පසුගිය කාලයේ දී ඔබ ලද පළපුරුද්ද පිළිබඳ සහතිකය ටෙන්ඩර්පත් සමග අමුණා එවිය යුතුයි. ආරක්ෂක සේවය සඳහා ඉල්ලුම් කරන ටෙන්ඩර්කරුවන් විසින් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගන්නා ලද අනුමැති සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

06. *බදු.*- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති රෙගුලාසි අනුව ගෙවිය යුතු බදු හා එහි ගෙවීම් සියලු දේ කොන්ත්‍රාත්කරු විසින් ගෙවීමට බැඳිය යුතුය.

07. *ටෙන්ඩර් පත්‍ර.-* ටෙන්ඩර් පත් 2008.11.07 දහවල් 12.00 දක්වා වවුනියාව මහ රෝහලේ මුදල් අංශයෙන් රාජකාරි වේලාවන්හි දී ලබා ගත හැකි ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය.

08. *ටෙන්ඩර්පත් එවිය යුතු අන්දම. -* සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයේ බහා 'වෛද්‍ය අධිකාරි, මහ රෝහල, වවුනියාව' යන ලිපිනයට එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවකට ද කවර අංශයක් වෙත ද පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ කෙලින්ම ගෙනවිත් භාර දිය හැකිය. සෑම ටෙන්ඩරයක් සඳහාම වෙන වෙනම ටෙන්ඩර් පත් එවිය යුතුය.

09. *ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය. -* 2008.11.14 පෙ. ව. 9.00 දක්වා ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ.

10. *ටෙන්ඩර්පත් විවෘත කිරීම.-* ටෙන්ඩර්පත් භාර ගැනීමේ වේලාවෙන් පසුව ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවන්හි ටෙන්ඩර් කරුවන්ට ඒ අසල සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින අයදුම්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙක් ඉදිරිපත් කරන ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් එම සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීමට හෝ මා විසින් පවරනු ලැබූ නියෝජිතවරයෙක්ගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ යුතුය.

ටෙන්ඩර් පටිපාටියට බාහිරව ඉල්ලුම් කරන ලද ටෙන්ඩර් අවලංගු කරනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා තීරණය අවසාන තීරණය වේ. තව ද ටෙන්ඩර්පත් නතර කිරීමට හෝ අලුතින් ටෙන්ඩර් කැඳවීමට හෝ අවලංගු කිරීමට සම්පූර්ණ බලය ටෙන්ඩර් මණ්ඩලයට ඇත. වැඩි විස්තර සඳහා 060-2241561 දුරකථනයට කථා කර දැන ගැනීමට හැකිය.

සභාපති,
ටෙන්ඩර් මණ්ඩලය,
මහ රෝහල,
වවුනියාව.

10-703

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - උඩුගම

**අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම**

උඩුගම මහෙස්ත්‍රාත් අධිකරණයට අදාල නඩුවල නඩු භාණ්ඩ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2008.11.08 දින පෙ. ව. 9.00 ට උඩුගම මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවල හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දිනට පැ. 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිළදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේම මුදල් ගෙවා ඒවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියළුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

06. ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

මහී විජේවීර,
මහෙස්ත්‍රාත්, බද්දේගම.

2008 සැප්තැම්බර් මස 29 වැනි දින,
බද්දේගම, මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උඩුගම මහෙස්ත්‍රාත් අධිකරණය - වෙන්දේසි ලැයිස්තුව**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 37934 | ඉරුම් කියත් | 01 |
| 02 | 37856 | වක්පිහි | 01 |
| 03 | 36098 | වක්පිහි | 01 |
| 04 | 33313 | පිහිය | 01 |
| 05. | 30457 | පිහිය | 01 |
| 06 | 29931 | පොරව | 01 |
| 07. | 29634 | පිහිය | 01 |
| 08. | 29632 | පිහිය | 01 |
| 09. | 72824 | පොරව | 01 |
| 10. | 37722 | තරාදි | 01 |
| 11. | 37496 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 12. | 37272 | පැදුරු | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 13. | 34617 | යකඩ බැංකුවල සවිකල ලී ඉරණ කියත් | 01 |
| 14. | 31155 | එම | 01 |
| 15. | 35931 | -එම- | 01 |
| 16. | අංක රහිත | මදක් දිරාගිය යකඩ බැංකුවට සවිකළ ලී ඉරණ කියත් | 01 |
| 17. | 36933 | පැදුරු | 01 |
| 18. | 36612 | පොරව | 01 |
| 19. | 36533 | පැදුරු | 01 |
| 20. | 36526 | බන්ඩ් කියත්, ඉරුම් කියත් | 01 |
| 21. | 36347 | බාල්දි | 01 |
| 22. | 36098 | වක්පිහි | 01 |
| 23. | 35983 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 24. | 35935 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 25. | 35449 | බාල්දි | 01 |
| | | සවල් | 01 |
| 26. | 34742 | කුඩ, සවල් | 01 |
| 27. | 28166 | දම්වැල් කියත් | 01 |
| 28. | 9507 | ඉරුම් කියත් | 01 |
| 29. | 37934 | එම | 01 |
| 30. | 26064 | උදළු | 01 |
| 31. | 30569 | බාල්දි | 01 |
| 32. | 35449 | සවල් | 01 |
| 33. | 31968 | සවල් | 01 |
| 34. | 32067 | තට්ටු තරාදි | 01 |
| 35. | අංක රහිත | පරණ හෙල්මට් | 05 |
| 36. | අංක රහිත | පරණ බැටරි | 02 |
| 37. | 36572 | ඇළුමිනියම් කල | 01 |
| 38. | 27236 | එම | 01 |
| 39. | 34635 | එම | 01 |
| 40. | 31374 | එම | 01 |
| 41. | අංක රහිත | ත්‍රිවිල් රෝද | 01 |
| 42. | 38207 | සවල් | 02 |
| | | උදළු | 02 |
| 43. | අංක රහිත | දිරාගිය වානේ අල්මාරි | 01 |
| 44. | අංක රහිත | දිරාගිය වානේ කැබිනට් | 01 |
| 45. | අංක රහිත | ආරක්ෂක පෙට්ටි | 01 |
| 46. | 37397 | අඩක් නිම කරන ලද මේස පුටු | 02 |
| 47. | 37821 | 1. අඩක් නිමකරන ලද ආසන 3 ඇඳි පුටු | 01 |
| | | 2. කුඩා ස්ටූල් | 01 |
| | | 3. අත් කියත් | 01 |
| | | 4. කියත් | 02 |
| | | 5. මිටි | 01 |
| 48. | අංක රහිත | සවල් | 20 |
| 49. | අංක රහිත | බාල්දි | 20 |
| 50. | අංක රහිත | වැල් කුඩ | 14 |
| 51. | 34617 | දම්වැල් කියත් | 01 |
| 52. | 6314 (බී-422/05) | අගල් 1 විෂ්කම්භය ඇති එස්ලෝන් බට | 05 |
| 53. | 38947 | ඇළුමිනියම් කළ | 01 |
| 54. | 39097 | ඉටි පැදුරු | 01 |

10-493

## පොලිස් අධිකාරී කාර්යාලය

### මරදාන පොලිස් දිසා බඩු ගබඩාවේ පරිහරණයට නුසුදුසු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මරදාන පොලිස් භූමියෙහි පිහිටි කොළඹ පොලිස් දිසා බඩු ගබඩාවේ ඇති පහත සඳහන් පාවිච්චියට නුසුදුසු භාණ්ඩ 2008.11.19 වැනි දින පැය. 9.30 ට එම ගබඩා භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය පවත්වනු ලබන දිනට පෙරදින එම ගබඩාවේ දී එම භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැකිය.

මිල දී ගනු ලබන භාණ්ඩවලට වහාම මුදල් ගෙවා එම භාණ්ඩ එදිනම භූමියෙන් ඉවත් කර ගත යුතුයි.

මෙම වෙන්දේසි ස්ථානයට වාහන රැගෙන නොයා යුතුයි.

මෙම වෙන්දේසිය සඳහා පැමිණෙන සියලුම දෙනා තම තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලික හැඳුනුම්පත රැගෙන ආ යුතුයි.

දයා සමරවීර,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
කොළඹ (මධ්‍යම).

### වෙන්දේසි කිරීමට ඇති භාණ්ඩ ලේඛනය

01. යකඩ කබඩ්
02. තහඩු අශ්වකෑම බාල්දි
03. ගෑස්ලිප්
04. අඟල් 20 කල්දේරම්
05. ලොකු ගෑස්සිලින්ඩර්
06. ගිනිනිවන උපකරණ
07. ගුවන් විදුලි යන්ත්‍ර
08. වර්ණ රූපවාහිනී යන්ත්‍ර
09. ලී කබඩ් පෙට්ටි
10. රයිඩින් හෙල්මට්
11. බ්‍රයිඩින් රයිඩින්
12. ස්ට්‍රප්ලෙදර්
13. හෙඩ්කොලර්
14. බීට්වෙල්හැම්
15. ස්ට්‍රප් අයන්ජෝඩු
16. කරිකොම්මැටල්
17. පන්චර් හැඩලරි
18. පැලෑෂ්ටෝච්ලයිට්
19. සාදල්
20. සදල්ගර්ත්
21. විල්බැරෝ
22. ඉබියතුරු
23. තිලඇඳුම් පෙට්ටි
24. 1994, 1995, 1996, 1997, 1998 කාකි රෙදි කැබලි
25. ගෑස්ලාම්පු
26. ටියුබ්ලයිට් කවර
27. සණක යන්ත්‍ර
28. බිත්ති ඔරලෝසු
29. රථ වාහන හෙල්මට්
30. අලවංගු
31. ඇලුමිනියම් කේතල
32. අශ්වකෑම බාල්දි

33. වතුරබාල්දි
34. විදුලි කේතල
35. මල්ටිපොට්
36. පැට්‍රල්මැක්ස් ලාම්පු
37. ලන්තෑරුම්
38. වතුර පිල්ටර්
39. ඇලුමිනියම් කේතල
40. තාච්චි
41. විදුලි හිරමනා
42. සිවිලින් විදුලි පංකා
43. සාදල්බෑග්ජෝඩු
44. වෙබ්රෙන්ස්
45. ලෙදර්රෙන්ස්
46. බ්‍රයිඩල්
47. පයිබර්ග්ලාස් ලොකු වතුර ටැංකි
48. පයිබර්ග්ලාස් කුඩා වතුර ටැංකි
49. කිලෝ 40 ගෑස් සිලින්ඩර්
50. හිරමනා
51. සවල්
52. කැසට් රේඩියෝ
53. ඇලුමිනියම් තැබිලි
54. දෑකැති
55. හිරමනා
56. 18 x 9 සාස්පාන්
57. 18 x 18 සාස්පාන්
58. ලී ඇදුම් අල්මාරි
59. යකඩ සේප්පු
60. අඟල් 2 වතුර මෝටර්
61. අරක්ෂක පෙට්ටි
62. කුඩා ඇලුමිනියම් සාස්පාන්
63. ඇලුමිනියම් ජොග්ගු
64. සෝනි ඩෙක් යන්ත්‍ර
65. පරිඝණක මොනිටර්
66. සුල්තානාදි පුටු
67. සුල්තානා අත්දිග පුටු
68. විසිකැති
69. මුදල් පෙට්ටි
70. ඇලුමිනියම් මුට්ටි
71. කාර්බිචේන්
72. පා පැදි
73. තණකොළ කපන යන්ත්‍ර
74. වානේ ලියන මේස
75. අඟල් 30 කල්දේරම්
76. අඟල් 36 කල්දේරම්
77. අශ්වාරෝහක කඩු
78. අධි විදුලි ලාම්පු
79. යුගල යකඩ ඇඳන්
80. නැෂනල් වීඩියෝ කැමරා
81. නැෂනල් වීඩියෝ කැමරා උපකරණ
82. ටී. වී. ඇන්ටනා
83. ප්ලාස්ටික් හෙල්මට්
84. සිලින්ඩර් සහිත ගෑස් ලාම්පු
85. යකඩ බැරිගේට්
86. අඟල් 15 සාස්පාන්
87. 12 x 10 සාස්පාන්
88. හදිසි අවස්ථා ලාම්පු
89. වර්ණ රූපවාහිනී යන්ත්‍ර
90. අඟල් 12 කල්දේරම්
91. අඟල් 24 කල්දේරම්
92. අශ්ව කෑම බාල්දි
93. විල්බැරෝ
94. අවිරාක්ක
95. යකඩ කැරකෙන පුටු
96. අඟල් 15 කල්දේරම්
97. අඟල් 32 කල්දේරම්
98. අඟල් 32 කල්දේරම්
99. අඟල් 16 කල්දේරම්
100. කුඩා ගැල්වනයිස් බාල්දි
101. වතුර බොයිලේරු
102. කුස්සි පිහියා
103. පරිගණක කීබෝඩ්
104. වැකුම් තියර්
105. ලාච්චු 3 වානේ කබඩ්
106. දොර පියන්
107. බිත්ති ඔරලෝසු
108. සිංහල යතුරු ලියන
109. ඉංග්‍රීසි යතුරු ලියන
110. ප්ලාස්ටික් කුඩා බාල්දි
111. මේස විදුලි පංකා
112. සිවිලින් විදුලි පංකා
113. යකඩ පුටු
114. ලී අල්මාරි
115. ලී මේස
116. අත්සහිත ලී පුටු
117. අත් රහිත ලි පුටු
118. ලී බංකු
119. ලී රාක්ක
120. විදුලි පන්දම්
121. කුඩා ගෑස් ලිප් කැබලි
122. යකඩ ඇන
123. යකඩ ඇඳන් පටි
124. ඇඳි සහිත වානේ පුටු
125. පැක්ස් යන්ත්‍ර
126. ස්ප්‍රේ ගන්
127. 5 1/2 ලී මේස
128. කැසට් රෙකෝඩර් හිතාචි
129. රෙකෝඩින් යන්ත්‍ර
130. කලු සුදු රූපවාහිනී යන්ත්‍ර
131. කැඩුණු යකඩ ඇඳන්
132. වානේ කුෂන් පුටු
133. ලාච්චු 4 වානේ කබඩ්
134. ජනෙල් රාමු.

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

සමාගමේ නම : වින්රේන් ඇඩ්වර්ටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ්.
සමාගමේ අංකය : PV65749
සංස්ථාගත කළ දිනය : 2008.10.02
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 408/සී, හයිලෙවල් පාර, පන්නිපිටිය.

නීතිඥ ෆ්‍රැන්සිස් ඩේවිඩ්,
සමාගමේ ලේකම්,

අංක 214/26,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

10 - 562

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ කරනු ලබන නිවේදනය

| | |
|---|---|
| සමාගමේ නම | : හෂ්වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : පී.වී. 65487 |
| සංස්ථා ගතකළ දිනය | : 2008 සැප්තැම්බර් 10 |
| කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය | : 73/16, සල්මල් පෙදෙස, තලපත්පිටිය පාර, ඇඹුල්දෙණිය. |

ලේකම්වරුන්

10-642

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ කරනු ලබන නිවේදනය

| | |
|---|---|
| සමාගමේ නම | : ග්ල්ට් සෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමාගමේ අංකය | : පී.වී. 65351 |
| සංස්ථා ගතකළ දිනය | : 2008 අගෝස්තු 29 |
| කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය | : 87/2 ඒ, නුවර පාර, මිරිස්වත්ත, ගම්පහ |

ලේකම්වරුන්

10-643

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සමාගම් පිළිබඳ දැන්වීමයි

| | |
|---|---|
| සමාගමේ නම | : එස්නා විලාස් ප්‍රයිවට් ලිමිටඩ් |
| සමාගමේ අංකය | : පී.වී. 65569 |
| කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය | : අංක 87, බාන්ස් පෙදෙස, කොළඹ 7 |

ලේකම්වරුන්.

ඉහත සමාගම වෙනුවෙන් බ්‍රිස්නස් ඉන්ටලිජන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 8, ටිකල් පෙදෙස,
කොළඹ 8.

10-644

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වන වගන්තිය යටතේ පහත සමාගම ලියාපදිංචි කරන ලද බව දැනුම් දීමයි

| | |
|---|---|
| සමාගමේ නම | : එස්. එන්. රිච් ලයිෆ් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම |
| ලියාපදිංචි අංකය | : පී. වී. 65548- 2008.09.15 දින |
| ලියාපදිංචි ලිපිනය | : 2 කණුව, කොක්කාවිල, මුගුනුවටවන |

සමාගමේ අධ්‍යක්ෂක.

10-665

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

| | |
|---|---|
| සමාගමේ නම | : ග්රූපෝ ආසිරි (පුද්ගලික) සමාගම |
| සමාගමේ අංකය | : පී.වී. 65819 |
| සංස්ථා ගතකළ දිනය | : 2008 ඔක්තෝබර් 08 |
| ලියාපදිංචි කාර්යාලය | : 101 සුරුවිල, නල්ලදරන්කට්ටුව, හලාවත |

සමාගම් ලේකම්.

10-669

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

සමාගමේ නම : නගිසා ඉන්ටර්නැෂනල් (පුද්ගලික)සමාගම
සංස්ථාගත අංකය : පී.වී. 65702
සංස්ථාගත කළ දිනය : 2008 සැප්තැම්බර් 26
ලියාපදිංචි කාර්යාලය : 231/1 රාස්සපාන පාර, ඉහල බෝමිරිය, කඩුවෙල.

සමාගම් ලේකම්.

10-670

## නිවේදනයයි

ආවේ ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් (පුද්ගලික ) සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ 2008 ඔක්තෝබර් මස 07 වැනි දින සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ආවේ ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය :පී. වී. 65809
ලියාපදිංචි කාර්යාලය : සමාගම් ලියාපදිංචි දෙපාර්තමේන්තුව, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

පී. වී. 65809 සමාගමේ ලේකම්.

10 - 687

## දැන්වීමයි

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැණික්හින්න පොල්අඹකොටුව අංක 96 හි පදිංචි කහවත්තේ හගලත් මුදියන්සේලාගේ සාමාවතී කුමාරිහාමි වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ, රජවැල්ල, දිගන අත්තම් නිවාස අංක 04 හි පදිංචි චමින්ද ප්‍රියංකර ජයලත් යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කළ 2008.02.02 වෙනි දින දී ඉනෝකා ගිම්හානි ජයලත් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 584 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරුට දී ඇති අයිතිවාසිකම් හා බලපුළුවන්කම් හා බලතල වර්ෂ 2008 ක් වූ සැප්තැම්බර් 22 වෙනි දින සිට බල රහිත හා ශුන්‍ය වන බව ප්‍රකාශ කරමි.

සාමා කුමාරි,
කහවත්තේ හගලක් මුදියන්සේලාගේ සාමාවතී කුමාරිහාමි.

2008 ක් වූ ඔක්තෝබර් මස 05 වැනි දින,

10 - 516

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : රන්සෙල් ස්පෙෂල් ෆිනිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී.වී. 65653, 2008.09.23
ලියාපදිංචි ලිපිනය : අංක 04, දේවාල පාර, පාගොඩ, නුගේගොඩ.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට් සෙකට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක 2689618

10 - 495

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 231, වෙන්නවත්ත, වැල්ලම්පිටිය යන ස්ථානයේ, පදිංචිව සිටින කංකානිගේ දයාසිරි සමරවීර නොහොත් කංකානමගේ දයාසිරි සමරවීර වන මා කංකානිගේ තිලකසිරි සමරවීර මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් නම් කොට ඇති ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. සිරිසේන විසින් සහතික කරන ලද අංක 400 සහ 2006.05.19 වෙනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන බවත්, මෙදිනෙන් පසු ඉහත ඇටෝර්නි බලපත්‍රය පිට ඔහු විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට මාගේ කිසිම වගකීමක් නොමැති බවත් රජයට සහ සියලුම ජනතාවට මෙයින් දැනුම් දෙමි.

කංකානිගේ දයාසිරි සමරවීර නොහොත්
කංකානමගේ දයාසිරි සමරවීර.

වර්ෂ 2008 ක් වූ සැප්තැම්බර් මස 16 වැනි දින දීය.

10 - 618

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කොන්කෝඩ් එක්සොටික් වොයේජස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2008 ක් වූ ජූනි මස 27 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : කොන්කෝඩ් එක්සොටික් වොයේජස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64579
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 74ඒ 1/1, පාක් වීදිය, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතුව
කෝ-සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

10 - 496

## නිවේදනයයි

ජේ. ජේ. ෆීඩ් ඇන්ඩ් ෆාමා (ප්‍රයිවට් ) ලිමිටඩ් සමාගම 2008 සැප්තැම්බර් මස 26 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ජේ. ජේ. ෆීඩ් ඇන්ඩ් ෆාමා (ප්‍රයිවට්) ලිමිටඩ්;
සමාගමේ අංකය : පී. වී. 65696 ;
ලියාපදිංචි කාර්යාලය : අංක 14/6, රජ මහා විහාර පාර, කෝට්ටේ

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

බිස්නස් සෙකටේරියල් සර්විසස් (ප්‍රයිවට් ) ලිමිටඩ්,
එන් (පී.වී.එස්) 20360
සමාගම් ලේකම්වරු.

10 - 695

## නිවේදනයයි

ගෝල්ඩන් ඩ්‍රගන් ඇග්‍රි එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2008 සැප්තැම්බර් මස 24 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ගෝල්ඩන් ඩ්‍රගන් ඇග්‍රි එක්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 65671
ලියාපදිංචි කාර්යාලය : දෙවන මහල, 375, වේල්ල වීදිය, කොළඹ 12.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස්
ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්, පී. වී. 259,
සමාගම් ලේකම්වරු.

10 -535

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008 සැප්තැම්බර් මස 11 වැනි දින සංස්ථාගත කරන ලදී :-

සමාගමේ නම : බිස්පෝක් ලංකා (පුද්ගලික ) සමාගම
සමාගමේ අංකය : පී. වී. 65496
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 285කේ, කලාප 07, මිලේනියම්සිටි, ඔරුවල, අතුරුගිරිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකෙට්‍රීස් (පුද්ගලික) සමාගම.

10 - 524/3

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008 සැප්තැම්බර් මස 11 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම ඃ තිරු කුමරන් ෆුඩ් වේව්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය ඃ පී. වී. 65495
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය ඃ අංක 55, හයිඩ්පාර්ක් කෝනර්, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස්
(පුද්ගලික) සමාගම.

10-524/1

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන වගන්ති ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඇලුම්කා ෆුඩ් කැබින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 65280
ලියාපදිංචි කළ දිනය ඃ 200808.25
ලියාපදිංචි ලිපිනය : 286 ඒ, තලවතුගොඩ පාර, හෝකන්දර දකුණ

සමාගමේ ලේකම්.

10 - 523

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008 සැප්තැම්බර් මස 22 වැනි දින සංස්ථාගත කරන ලදී ඃ-

සමාගමේ නම ඃ ශක්තිධරන් වෝටර් හයිබ්‍රිඩ්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය ඃ පී. වී. 65634
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය ඃ අංක 55, හයිඩ්පාර්ක් කෝනර්, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස්
(පුද්ගලික) සමාගම.

10-524/2

**අද්මිනිස්ත්‍රාසිකරුගේ පත්වීම පිළිබඳ දැන්වීම**

රිචඩ් රොබට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 410(1) වගන්තිය

සමාගමේ ලියාපදිංචි අංකය : N(PVS) 27936
සමාගමේ නම : රිචඩ් රොබට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලිපිනය : කිනගහලන්ද එස්ටේට්, කලගෙඩිහේන, ශ්‍රී ලංකාව
අද්මිනිස්ත්‍රාසිකරුගේ සම්පූර්ණ නම : ජෙරාඩ් පීවානන්දන් ඩේවිඩ්
අද්මිනිස්ත්‍රාසිකරුගේ කාර්යාල ලිපිනය : SJMS ඇසෝසියේට්ස් බාරේ, 4 වැනි මහල, නො. 2, කාසල් පටුමග, කොළඹ 04.
පත්කළ දිනය : 2008 සැප්තැම්බර් 27 දා

ජී. ජේ. ඩේවිඩ්,
අද්මිනිස්ත්‍රාසිකරු,
රිචඩ් රොබට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

10-525

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - රිදීගම ශාඛාව**

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රිදීගම නගරයට ආසන්නයේ පිහිටා ඇති කටුතම්පලාහේන නමැති ඉඩමේ බෙදා වෙන් කර ඇති කැබලි අංක 01 දරන විශාලත්වය අක්. 0, රූඩ් 0, පර්. 04 විශාල ඉඩම හා වටිනා ගොඩනැගිල්ල ද සමග මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.11.11 දින පෙ.ව. 11.30 දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.11.29 දිනදී *දිනමිණ* පුවත්පතේ 2002.07.05 දිනදී *ඩේලි නිවුස්* පුවත්පතේ 2002.07.05 දිනද *තිනකරන්* පුවත්පතේ 2002.07.05 දිනද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- රිදීගම නගරයේ ප්‍රධාන පාරට මුහුණ ලා එම පාරට මායිම්ව පාරේ වම් පසින් මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 037-22453 ෆැක්ස් අංකය : 037-22538

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල (සාම විනිසුරු),
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,

අංක 28 නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල.
දුරකථන අංකය : 037-20062

10-639

---

**මහජන බැංකුව - හික්කඩුව ශාඛාව**

1986 අංක 32 දරන පනතේ සංශෝධිත 1961 අංක : 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008 නොවැම්බර් මස 11 වැනි දින පෙ.ව. 11.00 ට මෙහි පහත විස්තර වන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දේපොළ පිළිබඳ විස්තරය**

01. දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ පටුවත පිහිටි වෙරළබඩ මිදිගහවත්ත නමැති ඉඩමේ ඒකාබද්ධ කැබලි වන ඒ, 2 ඒ සහ 3 ඒ දරන පර් 39.4 ක් විශාල ඉඩම සියලු වැවිලි හා ගොඩනැගිලි ද සමග වේ.

02. ඉහත කී පටුවත පිහිටි වෙරළබඩ මිදිගහවත්තේ ලොට් 5 හි ලොට් ඩී වලින් බෙදා වෙන් කළ ලොට් 01 දරන පර්චස් 32.833 ක් විශාල ඉඩම සියළු වැවිලි හා ගොඩනැගිලි ද සමග වේ.

වැඩි විස්තර සඳහා 1995.12.15 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 1995.12.01 දින දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම*.- කොළඹ සිට ගාල්ල දෙසට ගමන් කිරීමේදී දොඩන්දූව පටුවත ප්‍රදේශයේ දී හමුවන ඕෂන් බීච් ක්ලබ් හෝටලය අසල (මෙයට පෙර කි. මී. 102 කණුව අසල) පාරේ මුහුදු වෙරළ ඉදිරිපිට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි ගෙවීම් කළ යුතුය :

01. ගැණුම් මිලෙන් 10% ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1% ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
05. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත ගාල්ලේ, පහළ ඩික්සන් පාරේ, අංක 22 හි පිහිටි මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091-2223563, 2232311, 2234171 හා 2234174
පැක්ස් අංකය : 091-2232230.

හිමිකම් ඔප්පුව හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර,
දුරකථන අංකය : 041-2228731.

10-630

---

## මහජන බැංකුව - අම්බලන්ගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2008.11.17 දින පෙ.ව. 11.30 ට මෙහි පහත විස්තර වන දේපළ, දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කහව උඩුවරගොඩ පිහිටි, ලිඳමුල්ලවත්ත නමැති ඉඩමේ අංක 04 දරන කැබැල්ලට මානක ජී. එල්. ඩබ්ලිව්. පෙරේරා 1985.03.05 දින මැන සම්පාදිත අංක 3995 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකයි, පර්චස් නවයයි දශම පහක් (රූ. 01, පර්. 9.50) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේද වේ. වැඩි විස්තර සඳහා 2008.07.11 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2008.08.14 දින දිනමිණ හා ඩේලිනිවුස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය*.- ගාල්ල සිට අම්බලන්ගොඩ දෙසට යනවිට හමුවන කහව හන්දිය පසුකර යාර 100 ක් පමණ ගියවිට උඩුවරාගොඩ මාර්ගය (ටී. ආරියසේන ද සොයිසා මාවත) හමුවේ. එම මාර්ගයේ දුම්රිය මාර්ගය පසුකර මීටර් 200 ක් පමණ ඉදිරියට යනවිට පාරේ වම්පසට ඇති ගම්සභා පාර හමුවේ. එම පාරේ යාර 50 ක් පමණ ගිය විට පාරේ වම්පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10% ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට විකුණුම් මිලෙන් 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් ගැණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක් ද,
5. විකුණුම් වියදම හා වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත ගාල්ල, පහළ ඩික්සන් පාරේ, අංක 22 දරන ස්ථානයේ පිහිටි මහජන බැංකුව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 091-2232311, 2234171, 2234785 හා 2223564
ෆැක්ස් අංකය : 091-2232230.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපියෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගැනුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු, උසාවි කොමසාරිස්,
හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර,
දුරකථන අංක : 041- 2228731,
071-4438516.

10-631

## මහජන බැංකුව - දෙමටගොඩ ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ පෙතියාගොඩ පිහිටි අත්තික්කාගහ වත්ත ගොඩ ඕවිට/ගොඩවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අනිල් පීරිස් මහතා මැන සෑදූ අංක 2765 හා 1980.03.10 දිනැති පිඹුරේ ලොට් 2 දරන අක්. 0 රූ. 1 පර්. 75 (පර්චස් 40.075) විශාල බෙදා වෙන් කල ඉඩම සහ වරිපනම් අංක 604 දරන පරිශ්‍රය ඇතුළු එහි පිහිටි සියළු දේ මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.11.15 දින පෙ.ව. 11.00 ට, දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.08.01 දින ද, ඩේලිනිවුස් පුවත්පතේ, 2003.07.18 දින ද, දිනමිණ පුවත්පතේ 2003.07.17 දින ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- කොළඹ නුවර පාරේ පැලියගොඩ හන්දියෙන් දකුණට ඇති බියගම පාරේ පැලියගොඩ පසුකර සැතපුම් 01 ක් පමණ කැළණිය දෙසට යන විට ප්‍රධාන පාරට මායිම්ව පාරේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු වෙත (කොළඹ උතුර) අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01 ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 2387068, ෆැක්ස් අංකය : 2435977.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
සාමවිනිසුරු, වෙන්දේසිකරු, උසාවි
කොමසාරිස්, භාෂා පරිවර්තක හා තක්සේරුකරු.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ,
දුරකථන අංක : 2810145, 0777-212602.

10-677

## මහජන බැංකුව - වෙන්නප්පුව ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වෙන්නප්පුව නගර සීමාව තුළ පිහිටි නිවස සහ ඉඩම සහිත වටිනා දේපළ විශාලත්වය : අක්කර 04, රූඩ් 01.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.11.06 දින පෙ.ව. 10.00 ට, දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2008.04.04 දින ද, 2008.03.13 දිනැති දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් යන පුවත්පත් වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- මීගමුව සිට හලාවත පාරේ වෙන්නප්පුව නගරය පසු කිරීමේදී ලුනුවිලට, හැරෙන මංසන්ධිය හමුවේ. එය පසුකර මඳක් දුර ගිය පසු වම්පස ආර්පිකෝ ප්‍රදර්ශනාගාරය පිහිටා ඇත. එය ඉදිරිපස පාරේ දකුණු පැත්තේ ප්‍රධාන පාරට මුහුණලා මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, පුත්තලම ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 032-53301, ෆැක්ස් අංකය : 032-55247.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර,
මීගමුව,
දුරකථන අංක : 031-2223219 /2277518.

10-566

## මහජන බැංකුව - හලාවත ශාඛාව

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

හලාවත, පල්ලම ලිපිනයෙහි වතුපොල ගමේ පිහිටි ඉඩම සහ නිවස සහිත වටිනා දේපළ.
විශාලත්වය : රූඩ් 03, පර්චස් 30.6.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.11.10 දින පෙ.ව. 10.00 ට, දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2007.11.30 දින ද, 2008.09.26 දිනැති දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- හලාවත සිට පුත්තලම් පාරේ බංගදෙනිය හන්දියෙන් දකුණට ඇති ආනමඩුව පාරේ කි. මී. 12 ක් පමණ ගියපසු හමුවන පල්ලම හන්දියෙන් දකුණට ඇති වතුපොල පාරේ කි. මී. 05 ක් ගියපසු හමුවන වතුපොල තුංමං හන්දියෙන් දිස්ත්‍රික් මායිම් පාරේ දකුණට ඇති දෙවන නිවස සමග දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, පුත්තලම ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 032-53301, ෆැක්ස් අංකය : 032-55247.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර,
මීගමුව,
දුරකථන අංක : 031-2223219 /2277518.

10-565

## ගල්කිස්ස දිසා අධිකරණයේ දී ය.

කොල්ලුපිටියේ පිහිටි ව්‍යාපාරික ස්ථානයක් වෙන්දේසියේ විකිණීම

නඩු අංකය:
65/99/එම්. බී.

කොළඹ 06, වැල්ලවත්තේ ගාලු පාරේ අංක 343 දරන ස්ථානයේ පිහිටි වැල්ලවත්ත ශාඛාව යනුවෙන් හැඳින්වෙන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හෙවත් සීමාසහිත ලංකා වාණිජ බැංකුව

......................*පැමිණිලිකරු.*

01. රාජගිරිය, නාවල, උද්‍යාන පටුමග, අංක 26/1ඒ, හි රමනී වික්‍රමරත්න

02. රාජගිරිය, නාවල, උද්‍යාන පටුමග, අංක26/1ඒ හි ප්‍රේමදාස නානායක්කාර

..................................*විත්තිකරුවෝ*

ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති නිශ්චල දේපළ විකිණීමේ අධිකාරී පත්‍රයට අනුව ඉහත 1 සහ 2 විත්තිකරුවන්ගෙන් පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීමට ඇති රු. 8,00, 000 ක මුදලක් ද, ඒ මත 1998.02.26 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 28% බැගින් පොළිය ද, එම පොළිය මත 1% බැගින් පිරිවැටුම් බදු සහ එම පොළිය මත 4.5% බැගින් ආරක්ෂක බදු ද, නඩු ගාස්තු ද, මුල් මුදලේ ශේෂය වශයෙන් රු. 3,56,000 ක මුදලක් ද, 1998.02.25 වන දින දක්වා නොගෙවූ පොළිය වශයෙන් තවත් රු. 53,334.15ක් ද යනුවෙන් එකතුව රු. 4,09,334.15 ක් වන්නා වූ මුදලක් ද, එකී රු. 3,56,000 ක මුදල මත 1998.02.26 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 28% බැගින් පොළිය ද එම පොළිය මත 1% බැගින් පිරිවැටුම් බදු සහ එම පොළිය මත 4.5% බැගින් ආරක්ෂක බද්ද ගෙවිය යුතු බවට නියෝග කර එම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ දැක්වෙන නිශ්චල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට නියෝග කර ඇති බැවින් එම මුදල් අයකර ගැනීම සඳහා එකී දේපළ පිහිටි කොළඹ 03, කොල්ලුපිටිය, කොල්ලුපිටිය පටුමගෙහි (දැනට සැන්ට් ඇන්තනීස් පාර ) 'ලකී ප්ලාසා' නමින් හඳුන්වනු ලබන සුපිරි වෙළඳසැල් සංකීර්ණයේ පහත මහලේ පිටුපසට වම් පැත්තට පිහිටි ස්ථානයේ දී 2008 නොවැම්බර් මස 18 වැනි දින පෙ. ව. 11.00 ට මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය .*- කොළඹ ගාලු මුවදොර සිට ගාලු පාරේ ගාල්ල දෙසට යන විට කොල්ලුපිටිය හංදිය පසුකර මීටර් 300ක් පමණ දුර ගිය තැන වමට ඇති කොල්ලුපිටිය පටුමගෙහි (දැනට සැන්ට් ඇන්තනීස් පාර) මීටර් 50ක් පමණ ගිය විට දකුණු පැත්තට ඇති ලකී ප්ලාසා නමින් හඳුන්වනු ලබන සුපිරි වෙළඳ සැල් සංකීර්ණයේ පහත මාලයේ පිටුපසට වම් පැත්තට මෙම දේපළ පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම දේපළෙහි ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් මා වෙත කළ යුතුය. සියළුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරයකින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලෙන් සියයට විසිපහක (25%) මුදලක් එවලේම ගෙවිය යුතු ය. ගැණුම් මුදලේ ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල එදින සිට දින තිහක් (30) ඇතුළත ගල්කිස්ස දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත්කළ යුතුය.
02. දේපළ තක්සේරු කිරීමේ ගාස්තුව,
03. *ගැසට් පත්‍රයේ*, පුවත්පත්වල සහ අනිකුත් ප්‍රසිද්ධ කිරීමේ සියලුම වියදම්,
04. වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
05. විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නීතිඥ ගාස්තු,
06. සෝෂක සහ ලිපිකරු ගාස්තු,
07. කොළඹ මහ නගර සභාවට ගෙවිය යුතු 1% ක වෙළඳ බද්ද සහ එයට වැට් බද්ද.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත අංක 38 දරන බම්බලපිටිය කොට්ඨාසයේ, කොල්ලුපිටිය පටුමග, ඔස්සේ පිහිටි දැනට කොල්ලුපිටියේ පටුමග වරිපනම් අංක 70 (කොටසක්) දරන බලයලත් මිනින්දෝරු තැන්පත් පී. සින්නතම්බි විසින් සාදාන ලද අංක 2297 - 1989 පෙබරවාරි මස 17 වැනි දින දරන සැලැස්මේ නිරූපිත කොල්ලුපිටිය වරිපනම් අංක 70 (කොටසක් ) දරන එක්ස් 2 බිම් කැබැල්ලේ යළි මැනීමක් වන එක්ස් 2 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර ඇති එම සම්පූර්ණ ඉඩම සින්නදොරෙ විසින් සාදන ලද අංක 2448 ඒ හා 1989 ජුනි මස 20 වැනි දින දරන සහාධිපත්‍ය සැලැස්ම අනුව එකී එක්ස් 2 බිම් කැබැල්ලට මායිම්, උතුරට: කොල්ලුපිටිය පටුමග, නැගෙනහිරටඃ බලයලත් මිනින්දෝරු පී. සින්තම්බි විසින් සාදන ලද අංක 1303 දරන සැලැස්මේ ආර්.ඒ. ද මෙල් මාවතේ වරිපනම් අංක 390 දරන එකී එක්ස් 2 බිම් කැබැල්ල, දකුණට ඃ ආර්. ඒ. ද මෙල් මාවතේ වරිපනම් අංක 100/1 සිට 8 දරන ස්ථාන, බස්නාහිරට ඃ කොල්ලුපිටිය පටුමග වරිපනම් අංක 70 (කොටසක්) දරන එකී අංක 2297 දරන සැලැස්මේ එක්ස් 2 බිම් කැබැල්ල සහ එහි ප්‍රමාණය රූඩ් එකයි, පර්චස් විසි අටයි දශම තුනයි, දෙකයි (අ.0, රූ.1, පර්. 28.32) හෙවත් හෙක්ටයාර් 0.1728. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්. ඒ. 29/229 යටතේ ලියාපදිංචි කර ඇත.

2 වැනි උපලේඛනය

තට්ටු නිවාස ඒකකය 29 එකී කොල්ලුපිටිය පටුමග වරිපනම් අංක 70 (කොටසක් ) දරයි. ඊට මායිම්, උතුරට : මෙම ඒකකය හා සී. ඊ. 9 අතර ඇති බිත්තියේ මැද ; නැගෙනහිරට : මෙම ඒකකය හා 29 ඒකකයේ අතර ඇති බිත්තියේ මැද ; දකුණට : මෙම ඒකකය හා ඒකක සී. ඊ. 4 එළිමහන් කොටස අතර ඇති බිත්තියේ මැද; බස්නාහිරට : මෙම ඒකකය හා ඒකක 30 අතර ඇති බිත්තියේ මැද, පතුල ඒකක 15 සී. ඊ. 4 හා සී. ඊ. 5ට ඉහළින් ඇති මෙම ඒකකයේ කොන්ක්‍රීට් ගෙබිම, මුදුන ඉහළින් ඇති 50 ඒකකයේ කොන්ක්‍රීට් ගෙබිමේ මැද, ගෙබිමේ ප්‍රමාණය වර්ග මීටර් 26.8 (වර්ග අඩි 288). අංක 29 ඒකකය වූ කලී සාප්පුවකි. එය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්. ඒ. 31/107 යටතේ ලියාපදිංචි කර ඇත. අංක 29 ඒකකයට ආසන්නව පොදු ප්‍රදේශය වූ කලී සී. ඊ. 9 ද සහ සී.ඊ, 6.

*අයිතිය හා ඔප්පු පිළිබඳ විමසීමට.-* සමරරත්න ඇසෝසියේට්ස්, නීතිඥවරු සහ නොතාරිස්වරු, 2 වැනි මහල, අංක 810, මරදාන පාර, කොළඹ 10.

දුරකථන අංක ඃ 2672262, 2672263 සහ 2682480.

එන්. ජේ. එදිරිසිංහ,
සාම විනිසුරු,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

2008 ඔක්තෝබර් මස 10 වැනි දින දීය,
අංක 244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙනිය, නුගේගොඩ,

දුරකථන අංක ඃ 2833480, 0777-453463.

10-673

---

ලංකා බැංකුව

ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.08.22 දිනැති අංක 1,564 දරන *ගැසට් පත්‍රයේ* හා 2008.08.14 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2008.11.18 වැනි දින පෙ.ව . 11.30 ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. මහනාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

විකිණීමට ඇති දේපළ

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ උතුර, කළුතර බැද්දේ නාගොඩ හි පිහිටි 'ඔවන්ලින් එස්ටේට්' යනුවෙන් හඳුන්වන හා නමැති ටී. පී. අංක 54321 හි විස්තර කළ 'පින්නකොළලන්ද' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ටී. එෆ්. කොලට් විසින් සාදන ලද 1917 මාර්තු 17 දිනැති අංක 401 දරන පිඹුරේ විස්තර කළ ඉඩම් කැබැල්ල, උතුරට : රජයට අයිති එකී ඉඩම සහ අප්පුහාමි හිමිකම් කියන ඉඩම ද ; නැගෙනහිරට : රජයට අයිති එකී ඉඩම ද ; දකුණට : එම ඉඩමේ 'ඒ' වශයෙන් සඳහන් 1/4 කොටස ද ; බස්නාහිරට : මුල් පිඹුර අංක 52415 හි ඉඩම ද මායිම්ව එකී අංක 401 දරන පිඹුර අනුව අක්කර නවයයි, රූඩ් තුනයි පර්චස් විස්සක (අ. 09, රූ. 3, පර්. 20) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 162/272 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු කේ. එච්. මෙරිල් බී. පෙරේරා විසින් සාදන ලද 2005 ජූනි 14 දිනැති අංක 1718 දරන මෑත කාලයේ පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ උතුරේ කළුතර බැද්දෙහි කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ (නාගොඩ උප කාර්යාලය) කළුතර නාගොඩ හි පිහිටි 'ඔවන්ලින් එස්ටේට්' යනුවෙන් දැන් හඳුන්වන 'පින්නකොළලන්ද' නමැති ඉඩම එකී අංක 1718 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් විස්තර කළ බෙදන ලද්දාවූ හා නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : අප්පුහාමි හා අනෙක් අයට අයිති ඉඩම ද ; නැගෙනහිරට : පී. ඩී. ගුණරත්න, ඩී. ඒ. රාජපක්ෂ සහ නන්දසිරි ගුණසේකර යන අයට අයිති ඉඩම සහ පාර ද ; දකුණට : පාර, වෙන්දේසි ඉඩම සහ මනෝරි ප්‍රියංකා වීරසේකර, බන්දුල චන්ද්‍රසිරි, ඩබ්. ඒ. ලීලාවතී සහ ලැම්බර්ට් යන අයට අයිති ඉඩම් ද ; බස්නාහිරට : ප්‍රධාන පාර ද මායිම් ව එකී අංක 1718 දරන පිඹුර අනුව අක්කර නවයයි, රූඩ් දෙකයි, පර්චස් විසිඅටයි දශම දෙකක (අ. 9, රූ. 2, පර්. 28.2) බිම ප්‍රමාණය සමග එහි ඇති ගහකොළ වැවිලි සහ පිහිටි සියලු දේ වේ.

එම්. ජේ. පී. සල්ගාදු,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණිය ශාඛාව,
බොරුල්ල.

10 -659

---

## සෙලාන් බැංකුව පී. එල්. සී. - කොල්ලුපිටිය ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ දෙහිවල වෝඩ් 12 හි පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඕ. ආර්. සිල්වා විසින් සාදන ලද 1986 මාර්තු මස 01 දිනැති අංක 1518 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කරදගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ අංක 1302 ලකුණු කළ දෙහිවල, ගාළු පාර වරිපනම් අංක 75, 75 ඒ සහ 75බී දරන (කාණ්ඩ 43 සහ පත්‍රිකාව 73 හි ලියාපදිංචි කරන ලද දෙහිවල ලියාපදිංචි සැලසුම් අංක 01 හි ඒ කැබැල්ලෙහි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම හතයි හතක්, (අ. 0, රූ. 0, පර්. 5.77) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් දෙහි. 87/211, 212 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපළ, දෙහිවල සංස්ථාගත කිරීමේ සහතික අංක (එන්පීවීඑස්) 24672 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඊ පෝන් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2008ක් නොවැම්බර් මස 20 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම*.- දෙහිවල මංසන්ධියේ සිට ගාලු පාර ඔස්සේ කොළඹ දෙසට මීටර් 800ක් පමණ එන විට පාරේ දකුණු පස මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2008.05.16 වන දින පළ වී ඇති අතර සන්ඩේ ටයිම්ස් පත්‍රයේ, 2008.03.23 වන දින ද ලංකාදීප පත්‍රයේ 2008.03.26 වැනි දින දා සහ වීරකේසරී පත්‍රයේ 2008.03.27 වැනි දින ද පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1%ක් වන පළාත් අධිකාරි බද්ද 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී සෙලාන් බෑන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිම කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නː සහකාර සාමාන්‍යාධිකාරි (නීති), සෙලාන් බැංකුව පී. එල්. සී., අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක ː 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක : 011 - 2696155, 011- 2572940.

10-563

---

## මහජන බැංකුව - මාවතගම ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, තිරගන්දහය කෝරළේ මාවතගම පිහිටි වලව්වේ වත්ත නමැති ඉඩමට මැන සාදන ලද අංක 1362 සහ 1999.09.19 දිනැති පිඹුරේ ලොට් අංක 02 දරන විශාලත්වය අ. 0, රූ. 0, පර්. 05 ක් විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලුදේත් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2008.11.17 දින පෙ.ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.11.21 දින දිනමිණ පුවත්පතේ 2004.08.19 දින දී ද ඩේලි නිවුස් පුවත් පතේ 2004.08.19 දින ද තිනකරන් පුවත්පතේ 2004.08.19 දින දී ද පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- මාවතගම නගර මධ්‍යයේ ප්‍රධාන පාරට මුහුණ ලා වම් පසින් පිහිටි අංක 45 දරන ස්ථානයේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 037-2222453 ෆැක්ස් : 037-2222338.

හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම් අයි. ගල්ලැල්ල (සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු,

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත,
කුරුණෑගල,
දුරකථන අංක : 037-2220062.

10-633

---

## ලංකා බැංකුව - කඩවත ශාඛාව

### ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වන වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.09.05 දිනැති අංක 1,566 දරන *ගැසට් පත්‍රයේ* හා 2008.08.28 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කරන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2008.11.13 වෙනි දින පෙ.ව. 11.30ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

#### විකිණීමට ඇති දේපළ

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේපත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ (බත්තරමුල්ල කොට්ඨාස) තලංගම දකුණ ග්‍රාමයේ පිහිටි 'මුදකැලේ' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් සාදන ලද 1998 ජනවාරි 27 දිනැති අංක 696 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1බී වශයෙන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට ලොට් 1ඒ ද, නැගෙනහිරට : ලොට් 1සී (අඩි 10ක් පළල පාර සඳහා වෙන්කළ) දකුණට : එච්. එම්. සමරදාස හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : එම්. ප්‍රේමවතී පෙරේරා යන අනෙක් අය හිමිකම් කියන ඉඩමද, මායිම්ව එකී අංක 696 දරන පිඹුර අනුව පර්චස් දහයක (අක්කර 0, රූඩ් 0, පර්චස් 10) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි ගහකොළ වැවිලි සහ සියලු දේ වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 700/112 හි ලියාපදිංචි කර ඇත.

තවද, එකී අංක 696 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 සී (අඩි 10ක් පළල පාර සඳහා වෙන්කළ) මත පාරේ අයිතිය ද වේ.

එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු බී. බී. ප්‍රේමතිලක විසින් සාදන ලද 2004 පෙබරවාරි මස 05 දිනැති අංක 221 දරන මෑත මිණුම් පිඹුර අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී පරිදි තලංගම දකුණ ග්‍රාමයේ පිහිටි මිරිස්වත්ත, වරිපනම් අංක 159/45 දරන 'මුදකැලේ ' නමැති ඉඩම එකී අංක 221 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1බී1 වශයෙන් සඳහන් බෙදන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එච්. එම්. සමරදාස හිමිකම් කියන ඉඩමද, බස්නාහිරට : එම්. ප්‍රේමවතී පෙරේරා සහ අනෙක් අය හිමිකම් කියන ඉඩම ද, මායිම් ව එකී අංක 221 දරන පිඹුර අනුව පර්චස් දහයක (අක්කර 0, රූඩ් 0, පර්චස් 10) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි ගහකොළ වැවිලි සහ සියලු දේ වේ.

ඩබ්. පී. කෝනාර,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව.

10-660

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.